# මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණය ( SL 1-2006) යටතේ වන සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන.

1.1 මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව : යොමු අංකය : සිපිසි/සීමම්පීඩී/1/1/2/5(1) දිනය : 2013-08-05

1.2 මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය : යොමු අංකය : CPC/CMS/1/16/2/1 දිනය : 2013-08-07

1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය : යොමු අංකය : CPC/CS/2/3/බ.ගැ./C දිනය : 2013-08-12

1.4 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : 2014-01-01 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්යමණ්ඩලය

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NPC/10/P/GE/SR/6 දිනය : 2014-05-23

1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : CPC/PSC/2/26/3/5 දිනය : 2014-06-19

**02.** පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**03.** නිලධර ගණය පිළිබඳ විස්තර

3.1 නිලධර ගණය : විධායක

3.2 ශ්‍රේණි : III , II හා I

3.3 තනතුරු වලට පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ථ කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතර කොටසක් වශයෙන් ගැනිය හැක්කාවූ ද කාර්යයන් සහ සමූපකාර සමිති පනත, සමූපකාර සේවක කොමිෂන් සභා පනත, සමූපකාර රීති හා රෙගුලාසි, අති විශේෂ ගැසට් නිවේදන සහ බාහිර පනත් වලින් පැවරෙන බලය යටතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් / සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් පවරනු ලබන කාර්යයන් ඉටුකරනු ලබන නිලධර ගණයකි.

**04.** පත්වීමේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : SL 1-2006

5.2 වැටුප් පරිමාණය : රු. 22,935 -10 x 645 - 8 x 790 - 17 x 1050 - 53,555/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| III | 1 | 22,935/= |
| II | 12 | 30,175/= |
| I | 20 | 36,755/= |

06. නිලධර ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව :

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | III , II | 04 | සමූපකාර පනත හා රීති සහ රෙගුලාසි අනුව ඉටු කල යුතු කාර්යයන් සහ තනතුරට අදාලව සමූපකාර සංවර්ධන කොමසාරිස් / සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් පවරනු ලබන කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

04 යි. III හා II ශ්‍රේණියේ තනතුරු වේ. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III හා II ශ්‍රේණින් ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාල නොවේ. |
| සීමිත | අදාල නොවේ. |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2016/07/08 දින
අනුමත කරන ලදී

②



7.4 කුසලතා මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : උසස් වීමේ ශ්‍රේණියක් වන බැවින් අදාළ නොවේ.

7.4.2.2 පළපුරුද්ද : සුදුසුකම් සලකා බලන දිනට මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන නිලධාරි (විශේෂ ශ්‍රේණියේ) / දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස පත්වීමක් ලබා තිබීම.

හෝ

සුදුසුකම් සලකා බලන දිනට මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරේ I ශ්‍රේණියේ වසර (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම ශ්‍රේණියේ වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම.

7.4.2.3 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.4. වෙනත් :

1. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2.1 සිට 7.4.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට හා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
2. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්නම වසර (05) තුළම සතුටුදායක සේවා කාලයක් හා කාර්ය සාධනය සතුටුදායක හෝ ඉන් ඉහළ මට්ටමක තිබිය යුතුය.

7.4.3 බඳවා ගැනීමේ ක්‍රමය :

| | | |
|---|---|---|
| 7.4.3.1 | ලිඛිත පරීක්ෂණය | : අදාළ නොවේ. |
| 7.4.3.2 | වෘත්තිය පරීක්ෂණ | : අදාළ නොවේ. |
| 7.4.3.3 | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය | : අදාළ නොවේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී

ආණ්ඩුකාර ලේකම්

7.4.3.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර, එහිදී ගත්තා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඉහළම සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතුරින් අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාල නොවේ. |
| 2. වෘත්තීය සුදුසුකම් | 20 | |
| 3. පළපුරුද්ද | 60 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 05 | |
| 5. සම්මුඛ පරීක්ෂණය | 05 | |
| එකතුව | 100 | |

(ඇමුණුම 01 බලන්න)

7.4.3.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සටහන: මධ්‍යම පළාත් සභාවේ සමූපකාර විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් සභාපතිත්වය දරණ, අවම වශයෙන් මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විය යුතුය.

7.4.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත් වී / අන්තර්ග්‍රහණය වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී /අන්තර්ග්‍රහණය වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 04) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :
වර්ෂයකට අවම වශයෙන් දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද :
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
........2019/07/08........ දින
අනුමත කරනු ලදී.

3



09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

| ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි විධිවිධාන අනුව අදාල මට්ටමේ (1 කාණ්ඩයේ) ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටියට අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 පූර්ව අවශ්‍යතා :

I. කළමනාකරණ හෝ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
II. නිලධර ගණයේ II ශ්‍රේණියේ වසර හතක් (07)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හතක් (07) ක් උපයාගෙන තිබීම.
III. පූර්වාසන්න වසර පහ (05) තුළම සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටියට අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හතක් (07) ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
V. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

10.2.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. අන්තර්ග්‍රහණ ක්‍රමවේදය : (නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)

මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සමූපකාර සංවර්ධන සහකාර (උප) කොමසාරිස්වරුන්, සේවා කාලය පදනම් කර ගනිමින් මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ III/II ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කෙරේ. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

13. අර්ථ නිරූපණ හා නිර්වචන

13.1 "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

13.2 "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

13.3 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයා වේ.

13.4 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ සමූපකාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

13.5 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන කොමසාරිස් /සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වේ.

13.6 "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටුකිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය ඉදිරියේ උපයාගතව තිබූ සියළුම වැටුප් වර්ධක උපයා ගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

13.7 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, මධ්‍යම පළාත් මූල්‍ය රීති සහ දෙපාර්තමේන්තු නියෝග සහ රජය / මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 01

## ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය

01. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණ : සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගැනීම.

02. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| **අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 10**<br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක පශ්චාත් උපාධියක් ලබා තිබීම. - ලකුණු 06<br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. - ලකුණු 04 | 10 | අදාළ නොවේ. |
| **වෘත්තීය සුදුසුකම් - ලකුණු 20**<br>01) දේශීය පාඨමාලා - ලකුණු 10<br>රජයේ පිළිගත් ආයතනයක් (SLIDA," INGAF" ,NICD) විසින් පවත්වනු ලබන කළමනාකරණ හෝ ඒ හා සමාන වසරක් හෝ ඊට වැඩි කාලයකට අදාළ ඩිප්ලෝමාවක් හෝ උසස් ඩිප්ලෝමාවක් සමත් වීම.<br>02. වෙනත් දේශීය/විදේශීය පාඨමාලා - උපරිම ලකුණු 10<br>බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික වෘත්තීය සුදුසුකම් වලට හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවලට අමතරව හදාරන ලද වෘත්තීය විෂයගත පාඨමාලා<br>1. දින 90ට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම - ලකුණු 10<br>2. දින 30ට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම - ලකුණු 05<br>3. දින 10ට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම - ලකුණු 03<br>4. දින 05ට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් හදාරා තිබීම - ලකුණු 02 | 20 | |
| **පළපුරුද්ද - ලකුණු 60**<br>1. සුදුසුකම් සලකා බලන දිනට සමුපකාර සංවර්ධන නිලධාරී (විශේෂ ශ්‍රේණියේ) / දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස පත්වීම් ලබා ඇති නිලධාරියෙකු සඳහා විශේෂ ශ්‍රේණියේ වසරක් සඳහා ලකුණු 10 ක් බැගින් වසර 03ක් සඳහාද, සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ වසර පහක් ඉක්මවූ පසු එළඹෙන සෑම වසරක් සඳහාම ලකුණු 06 බැගින් ද තනතුරු දෙකෙහිම උපරිම වසර 08 කට ලකුණු හිමි වේ.<br>(වසරකට අඩු සේවා කාලයක් ඇතිවිට මාස 06ක් හෝ ඊට වැඩි නම් වසරකට හිමි ලකුණු ප්‍රමාණයෙන් අඩක් හිමි වේ.) | 60 | |
| **භාෂා ප්‍රවීණතාව - ලකුණු 05**<br>(සන්ධාන භාෂාවේ හා අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීනතාවය)<br>රජය පිළිගත් ආයතනයක හදාරන ලද ඉංග්‍රීසි භාෂා පාඨමාලා<br>1. ඩිප්ලෝමා - ලකුණු 03<br>2. සහතික පත්‍ර පාඨමාලා/අ.පො.ස. සාමාන්‍ය පෙළ (සම්මාන) - ලකුණු 02 | 05 | |
| **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය - ලකුණු 05**<br>(නායකත්වය, පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා, ආකල්ප, යනාදිය සලකා බලනු ලැබේ.) | 05 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම

**මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

01. විභාගයේ නම : I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන රෙගුලාසි | පැය 01 | 100 | 40 |
| 2. මූදල් රෙගුලාසි | පැය 01 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : අවම වශයෙන් වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන රෙගුලාසි | ආයතන සංග්‍රහයේ II, IV,V,VII,VIII, XII, XIII වන පරිච්ඡේද |
| 2. මූදල් රෙගුලාසි | මූදල් රෙගුලාසි සංග්‍රහයේ I,II,III,IV,VI,VIII පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

5



ඇමුණුම - 03

**<u>මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u>**

01. විභාගයේ නම : II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට අවම වශයෙන් දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | සමුපකාර සමිති පනත , රීති හා රෙගුලාසි ආශ්‍රයෙන් විෂයානුබද්ධ දැනුම පරීක්ෂා කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 04

**මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

01. විභාගයේ නම : III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40 |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට අවම වශයෙන් දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම<br>II. කළමනාකරණ ශ්‍රිතයන්<br>III. සහභාගිත්ව කළමනාකරණය<br>IV. කළමනාකරණ පරිසරය |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-07-08 දින
අනුමත කරන ලදී.
[signature]
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමි

01. එස්.බී.බැද්දෙවෙල මහතා (සභාපති) ..............................

02. යූ.ජ්.බෝගහපිටිය මහතා (සාමාජික) ..............................

03. පී.පී.එස්.ජ්.දිසානායක මිය (සාමාජික) ..............................

04. වෛත්‍යලිංගම් තන්දකුමාර් මහතා (සාමාජික) ..............................

05. ජ්.ජේ.එම්. මොහිදීන් තිස්තාර් මහතා (සාමාජික) A.J.M.M. Thisthar ..............................

දිනය 2014-06-24

ආණ්ඩුකාර ලේකම්,

2014-06-24 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 14/795 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණය (SL1-2006) යටතේ වන සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2014-06-25

..............................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත
තිල මුද්‍රාව

**ආර්. එම්. එන්. රත්නායක**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/නොකරමි.

..............................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර

දිනය ..............................

අනුමත කරමි / නොකරමි
..............................
ටිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරව
20 14.07.01